## විද්‍යාපීඨ ප්‍රවේශයට 2020 වර්ෂය සඳහා අයදුම් කළ සියලුම අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය පිණිසයි

## 2018 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවා ගැනීම - 2020

1. එක් එක් පාඨමාලා සඳහා මාධ්‍ය අනුව දිස්ත්‍රික් පදනමින් පළමු වටයේ සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්කරුවන් කැඳවන ලද කඩඉම් ලකුණු මේ සමඟ දැක්වේ.

2. **කඩඉම් ලකුණු සඳහන් වගු පරීක්ෂා කිරීමට පෙර පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, මනා ලෙස අවබෝධ කර ගත යුතු වේ.**

3. ඒ පිළිබඳ අනවධානයෙන් යුතුව, තමන්ගේ Z අගය සම්බන්ධව පමණක් අවධානය යොමු කරමින් තමන්ට අවස්ථාව නොලැබීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් විමසීම් කිරීම හැකිතාක් අවම කරන ලෙස අයදුම්කරුවන් වෙත විශේෂයෙන් දැනුම් දෙනු ලැබේ.

4. • එක් එක් පාඨමාලාවලට අවශ්‍ය අ.පො.ස.(උ.පෙළ) විෂයධාරාව හා අදාළ විෂය සහිත අයදුම්කරුවන්ව පමණක් පරිගණක දත්ත ඇසුරින් තෝරා සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇත. දිස්ත්‍රික්ක අනුවත්. පාඨමාලාවලට විශේෂ වූ විවිධ සුදුසුකම් මත, විවිධ කෝටා අගයන් යටතේ බඳවා ගැනීමේ දී ඒ අනුවත් කඩඉම් Z අගයෙ හි වෙනස්කම් පැවතිය හැක.

5. • ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවට දිස්ත්‍රික්ක පදනමින් අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය (Online System) ඔස්සේ අයදුම්කිරීමේ දී ගැසට් නිවේදනය කියවා අවබෝධ කරගත් ආකාරය අනුව සඳහන් කළ ක්‍රීඩා ලකුණු අනුව කඩඉම් ක්‍රීඩා ලකුණු තීරණය වී ඇත.

   • කෙසේ නමුත් සම්මුඛ පරීක්ෂණයේ දී ක්‍රීඩා සහතික පත් ඉතා හොඳින් පරීක්ෂාවට ලක්වන අතර එහි දී අයදුම්කරුවන්ගේ ක්‍රීඩා ලකුණු සංශෝධනයට ලක් වීමටත්, ඒ අනුව සඳහන් කළ නිවැරදි ක්‍රීඩා ලකුණු අනුපිළිවෙල අනුව නියමිත පුරප්පාඩු පිරවීමත් සිදු කරනු ලැබේ.

6. ඉංග්‍රීසි පාඨමාලාවේ දී 2020.09.04 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් අනුපිළිවෙල මත දිස්ත්‍රික්ක පදනමින් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර කඩඉම් Z අගය, එම අනුපිළිවෙල මත අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන වන පරිදි කැඳවූ අවසන් අයදුම්කරුගේ Z අගය වේ.

   අදාළ අනුපිළිවෙල පහත පරිදි වේ.

   i. 2018 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (විෂය අංක 73) සහිතව විෂයන් තුනකින් එකවර සමත් වීම
   ii. අදාළ අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම
   iii. අදාළ අ.පො.ස (උ.පෙළ) සුසුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම

7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාඨමාලාවේ දී 2020. 09.04 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් අනුපිළිවෙල මත දිස්ත්‍රික්ක පදනමින් අයදුම්රුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර, කඩඉම් Z අගය එම අනුපිළිවෙල මත අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන වන පරිදි කැඳවූ අවසන් අයදුම්කරුගේ Z අගය වේ.

අදාළ අනුපිළිවෙල පහත පරිදි වේ.

I. 2018 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් සහිත ව විෂය තුනකින් සමත් වීම
II. 2018 වර්ෂයේ දී අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිත ව විෂය තුනකින් එකවර සමත් වීම
III. 2018 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂය තුනකින් එකවර සමත් වීම
IV. 2018 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාවෙන් විෂය තුනකින් එකවර සමත් වීම
V. 2018 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී කලා, වාණිජ්‍යය, තාක්ෂණවේදය හා "වෙනත්" යන ඕනෑම විෂය ධාරාවක් යටතේ ඕනෑම විෂය තුනකින් එකවර සමත් වීම

8. ඒ අනුව ඉංග්‍රීසි, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාඨමාලාවල දී එක්, එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගන්නා සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ දී, ඒ සඳහා සුදුසුකම් ලබන අවසන් අයදුම්කරු අයත් වන ඉහත කී අධ්‍යාපන සුදුසුකම් කාණ්ඩයට පහළින් ඇති අධ්‍යාපන සුදුසුකම් සහිත, නමුත් සම්මුඛ පරීක්ෂණයට නො කැඳවූ ඉහළ Z අගය සහිත අයදුම්කරුවන් සිටිය හැකිවේ.

9. • ප්‍රාථමික අධ්‍යාපනය, විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) , ගණිතය (ඉංග්‍රීසි මාධ්‍යය) , සමාජීය විද්‍යාව, කෘෂි හා ආහාර තාක්ෂණය යන පාඨමාලාවලට විවිධ සුදුසුකම් යටතේ බඳවා ගන්නා කෝටා අගයන් ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති බැවින්, බඳවා ගන්නා මුළු සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව අදාළ කෝටාවන් සඳහා වෙන් කර, ඊට සමාන සංඛ්‍යාවක් වන පරිදි එක් එක් සුදුසුකම් යටතේ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණටය කැඳවන අතර, කඩඉම් Z අගයයන් ඒ අනුව දිස්ත්‍රික්ක මට්ටමින් දන්වා ඇත. ඒ අනුව එම පාඨමාලාවලට විවිධ කාණ්ඩ යටතේ පවතින කඩඉම් Z අගය, එකම දිස්ත්‍රික්කය තුළද වෙනත් අගයන් විය හැක.

• ගැසට් නිවේදනයේ අදාළ පාඨමාලාව සඳහා යම් දිස්ත්‍රික්කයක පුරප්පාඩු නොමැතිවේ නම්, එය "NV" (No Vacancies) ලෙස දන්වා ඇත.

• සුදුසුකම්ලත් අයදුම්කරුවන් යම් පාඨමාලාවක් සඳහා අදාළ දිස්ත්‍රික්කයෙන් අයදුම් කර නොමැති වේ නම්, ඒ සඳහා ද "NV" (No Vacancies) ලෙස දන්වා ඇත.

**10. බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා පූජ්‍ය පක්ෂය නියමිත සංඛ්‍යාව බඳවා ගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික්ක පදනමින් ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ගිහි අයදුම්කරුවන් බඳවා ගැනීමට නියමිතය. ඒ අනුව පළමුව පැවැත්වෙන පූජ්‍ය පක්ෂ්‍ය සඳහා වන සම්මුඛ පරීක්ෂණ අවසන්වන තුරු ගිහි අයදුම්කරුවන් සඳහා වන කඩඉම් Z අගයන් ප්‍රකාශ කළ නොහැකි බැවින් එම දත්ත ඉදිරිපත් කර නැත.**

11. කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය පාඨමාලා සඳහා ද සමස්ත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක් පූජා /පූජක පක්ෂයෙන් බඳවා ගැනීම කළ යුතු බැවින්, ඊට අදාළ කඩඉම් Z ලකුණ කෙරෙහි එහි බලපෑමක් පැවතිය හැක.

12. **කඩඉම් Z අගය තීර්ණය කිරීමේ** දී අයදුම්කරුවන්ගේ අ.පො.ස (සා.පෙළ) සුදුසුකම්, ඉංග්‍රීසි පාඨමාලාවේ දී හැර අන් කිසිදු පාඨමාලාවක දී සලකා බලා නොමැති අතර, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කළ සහතිකපත් ආදිය ද සලකා බලා නොමැති බව සැලකිය යුතු වේ.

13. ඒ අනුව, ඉහත සියලු කරුණු ප්‍රකාර ව සම්මුඛ පරීක්ෂණයට නො කැඳ වූ අයදුම්කරුවන් තමන්ගේ සැබෑ තත්ත්වය අවබෝධ කර ගත යුතු අතර, ඉතා ම සුවිශේෂී කරුණක් වේ නම් හැරෙන්නට සරල පැහැදිලි කිරීම් සඳහා නැවත නැවත දුරකථන ඇමතුම් ලබා දීමෙන් වළකින ලෙසට කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.